GPOBA
Global Partnership on Output Based Aid Project
NATIONAL WATER SUPPLY & DRAINAGE BOARD

E-mail: dpmchandana@gmail.com Tel: 011-2504273 No: 480 B, Roxy Garden, Colombo-06

2016.01.25

හිතවත් මහත්මයාණෙනි / මහත්මියණි,

<u>ලෝක බැංකු ආධාර යටතේ අඩු ආදායම් ලාභීන්ට මලාපවහන සේවා සහනදායි ක්‍රමයට සැපයීමේ ව්‍යාපෘතිය (GPOBA ව්‍යාපෘතිය)</u>

<u>ගෘහස්ථ අපජල පිරිපහදු පද්ධතියක් ඉදිකිරීම</u>

ශ්‍රී ලංකා රජය සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රතිපාදනත් හා ලෝක බැංකු ආධාර යටතේ මහජන දායකත්වය ද උපයෝගී කරගනිමින් GPOBA ව්‍යාපෘතිය මගින් දෙහිවල/ගල්කිස්ස ,මොරටුව, කොළොන්නාව සහ ජා-ඇළ / ඒකල ප්‍රදේශවල ජීවත්වන අඩුආදායම්ලාභී ප්‍රජාවගේ ගෘහස්ථ අපජල පද්ධතිය වැඩිදියුණු කොට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇත.

මෙම ව්‍යාපෘතිය මගින් ඔබගේ සහ ඔබගේ පවුලේ සාමාජිකයින්ගේ සෞඛ්‍ය තත්වය උසස් මට්ටමකින් පවත්වා ගෙනයාම සහ ඔබ ජීවත්වන අවට පරිසරය දූෂණයවීම අවම කිරීම සඳහා වැසිකිළි හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කොට ජීවත්වීමට සුදුසු පරිසරයක් නිරිමාණය කිරීම අපේක්ෂාවයි.

දෙහිවල / ගල්කිස්ස ,රත්මලාන,මොරටුව, කොළොන්නාව සහ ජා-ඇළ / ඒකල ප්‍රාදේශිය කොට්ඨාශ තුල පදිංචි අඩුආදායම්ලාභී මාසික ආදායම රු.30,000.00 හෝ ඊට අඩු සහ තම නිවස පිහිටි ඉඩමේ ප්‍රමාණය පර්චස් 20 ට අඩු ප්‍රජාව වෙත මෙම ව්‍යාපෘතිය මගින් ප්‍රමුඛත්වය ලබාදෙනු ඇත. මාසික ආදායම සහ ඉඩමේ ප්‍රමාණය අවම අගයෙන් පටන්ගෙන වෙන්කර ඇති මලාපවහන සබදතා ප්‍රමාණය දක්වා සුදුස්සන් තෝරා ගනු ලැබේ. මෙම පද්ධතිය පොලව යට ඉදිකිරිමට අඩි 8x6 සහ අඩි 5x5 ක ඉඩ ප්‍රමාණයක් අවශ්‍යවේ.

1. ඒ අනුව තෝරාගත් සෑම නිවසකටම නව පූතික ටැංකි (Septic Tank), නිර්වායු පිරිපහදු පද්ධතිය (Anaerobic Filter)හා පොලොවට උරාගන්නා ටැංකි (Soakage Pit) ඔබ නිවසට අයත් ඉඩමේ ඉදිකිරීම. (නිවාස 950)
2. මුළුතැන්ගෙයි අපජලය, වැසිකිළි අපජලය සහ නාන කාමරයේ අපජලය මල නල යොදා මෙම පිරිපහදු පද්ධතියට සම්බන්ධ කිරිම. (නිවාස 950)
3. මෙම නිවාස අතරින් වැසිකිළි නොමැති නිවාස සඳහා අළුතින් වැසිකිළි ඉදිකිරිම (මෙම නිවාස 950න් නිවාස 285කට පමණි.)
4. මෙම පූතික ටැංකි වසර 4 ක කාලයක් පිරිපහදු කිරිම සහනදායි මිලකට සිදුකිරිම(පලමු වසර සඳහා ඔබට වැයවන මුදලෙන් 50%ක් ව්‍යාපෘතිය මගින් දරන අතර දෙවන, තුන්වන සහ හතර වන වර්ෂ සඳහා රු. 675/- ක මුදලක් ව්‍යාපෘතිය මගින් ගෙවනු ලබයි)

මෙම ව්‍යාපෘතිය මගින් උක්ත පිරිපහදු පද්ධතිය සහ වැසිකිළිය ඉදිකිරිම සඳහා එක් නිවසකට රු.100,000/- ක පමණ මුදලක් දරන අතර වැසිකිළි නොමැතිව පිරිපහදු පද්ධතිය පමණක් ඉදිකිරිම සඳහා එක් නිවසකට රු.65,000/- පමණ මුදලක් දරනු ලැබේ. නමුත් අප ව්‍යාපෘතිය මේ සඳහා ඔබගෙන් අය කරනු ලබන්නේ රු.1,950/- ක මුදලක් පමණි.

මෙම පද්ධතිය ලබා ගැනිමට මෙම විස්තර පත්‍රිකාව සමග ලැබෙන අයදුම්පත නිසිලෙස පුරවා ඔබ පදිංචි ඉඩමේ ප්‍රමාණය හා ඔබගේ ආදායම, ග්‍රාම නිළධාරි හෝ සමෘද්ධි සංවර්ධන නිළධාරි විසින් සහතික කර අදාල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ලේකම්තුමා / තුමියගේ අනුමැතියත් ප්‍රාදේශිය සභාව / නගර සභාවේ හෝ මහ නගර සභාවේ සභාපතිතුමාගේ / නගරාධිපතිතුමාගේ අනුමැතියත් සමග ව්‍යාපෘති කාර්යාලයට ඉදිරිපත් කල යුතුය. මෙම තෝරා ගැනිම් ඔබ නගර සභාව/ ප්‍රාදේශිය සභාවේ සභා අනුමැතියට යටත්ව සිදුකරනු ලබනු ඇත. තවද මෙම ව්‍යාපෘතියේ අයදුම්කරුවන් තෝරා ගැනිම සම්බන්ධව හෝ ව්‍යාපෘතිය මගින් කිසියම් අපහසුතාවයකට පත්වන්නේ නම් ඒ සම්බන්ධව ඔබගේ පැමිණිලි පහත ලිපිනයට හෝ දුරකථන අංකයට යොමුකරන්න.

ව්‍යාපෘති කළමණාකරු ,(GPOBA ව්‍යාපෘතිය)
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
අංක 480බී, රොක්සි උද්‍යානය
වැල්ලවත්ත
දුරකථන : 011-2504273

.....

ව්‍යාපෘති කළමණාකරු
(GPOBA ව්‍යාපෘතිය)

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය